// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 1947/15 - 2015 දෙසැම්බර් මස 29 වැනි අඟහරුවාදා - 2015.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම**
**(ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වන අධිකාරිය)**

විනිමය පාලන පනතේ 44 වගන්තිය සමග කියැවෙන එකී පනතේ 6AB වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම මෙම නියෝගය මගින් ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් පහත සඳහන් දෑ සම්බන්ධයෙන් විනිමය පාලන පනතේ 6AB වගන්තිය යටතේ දක්වා ඇති අවශ්‍යතාවයන් අදාළ වීමෙන් නිදහස් කරනු ලැබේ.

(අ) අංක 1947/13 දරන 2015.12.29 දිනැති රජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද විධානය මගින් මුදල් අමාත්‍යවරයා විසින් ප්‍රදානය කෙරෙන අවසරය ප්‍රකාරව අත්පත් කරගත්, රඳවාගත් හෝ පැවරූ සුරැකුම්පත් ; සහ

(ආ) 1947/14 දරන 2015.12.29 දිනැති රජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයේ පළ කරන ලද, විනිමය පාලන පනතේ 7 වන වගන්තිය යටතේ විනිමය පාලක විසින් ප්‍රදානය කරන ලද අවසරය යටතේ අත්පත් කරගත් ප්‍රාග්ධන ස්වරූපයේ වෙනත් ඕනෑම වත්කමක්.

රවි කරුණානායක,
මුදල් ඇමති.

2015 දෙසැම්බර් මස 21 දින,
කොළඹ,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

01 - 504

1A - G 22781 — 26 (2015/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*